# ලංකා දේශපාලනයට මහත්මා ගුණය එකතුකළ ජනපති



දිවංගත ඩී. බී. විජේතුංග මහතා



**ශ්‍රී** ලංකාවේ කලක් අගමැතිවරයෙකු සිටි, එසේම තුන්වන විධායක ජනාධිපති පදවිය ද ඉසිලූ ඩිංගිරි බණ්ඩා විජේතුංග මැතිතුමෝ රෝගාතුරව සිට පසුගිය මස 21 දින මහනුවර රෝහලේ දී අභාවප්‍රාප්ත වූහ. ආදාහන කටයුතු 25 වෙනි දින සියළු රාජ්‍ය ගෞරව සහිතව මහනුවර ගැටඹේ නාගරික ක්‍රීඩා පිටියේදී දී අති විශාල ජනකායක් අභියස සිදුකරන ලදී. මිය යනවිට එතුමන්ගේ වයස 92 ක් වීය.

1916 පෙබරවාරි 15 වෙනි දින මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සිංහළ බෞද්ධ පවුලක උපත ලැබූ විජේතුංග මහතා අධ්‍යාපනය ලැබූයේ ගම්පොළ ශාන්ත ඇන්ඩෲ විදුහලෙනි. ද්වීතීය අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසුව හෙතෙමේ සමූපාකාර පරීක්ෂකවරයෙකු ලෙස ජීවිතය ඇරඹුවේය. එකල මහනුවර පළාතේ පළපුරුදු දේශපාලකයින්ව සිටි ජෝර්ජ් ඊ. ද සිල්වා සහ ඒ. රත්නායක යන මහතුන්ගේ ඇසුර ලැබූවේය. රත්නායක මහතා ඒ යුගයේ දී ඩී. එස්. සේනානායක රජයේ ආහාර ඇමති වූ විට ඔහුගේ පුද්ගලික ලේකම් ධුරයට විජේතුංග මහතා පත්කරගන්නා ලද්දේය.

1946 දී එක්සත් ජාතික පක්ෂයට බැඳුණ මුත් 1965 මහ මැතිවරණයේදී ප්‍රථම වතාවට උඩුනුවර ආසනයට තරඟකොට එහි මන්ත්‍රී ලෙස තේරී පත්ව පාර්ලිමේන්තුවට ගිය විජේතුංග මහතා ඒ කාලයේ විශිෂ්ඨ මන්ත්‍රීවරයෙකු ලෙස කැපී පෙනුණේ ඔහු ඉතා වෙහෙස මහන්සිව තම ඡන්ද කොට්ඨාශයේ පාක්ෂික හෝ පාක්ෂික නොවන සියළු දෙනාගේ හිත සුව පිණිස කටයුතු කළ මන්ත්‍රීවරයෙකු වූ බැවිනි.

1970 මැතිවරණයේදී ඔහු උඩුනුවරින් පරාජයට පත්වූ මුත් නැවත 1977 යූඇන්පී මහා ජයග්‍රහණයේදී යළිත් උඩුනුවරට තේරී පත්වූවා පමණක් නොව, එම ජේආර් රජයේ ප්‍රවෘත්ති හා ගුවන්විදුලි ඇමතිවරයා වශයෙන් විජේතුංග මහතා පත්කරන ලද්දේය. එපමණක් නොව එම යුගයේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය, මහාමාර්ග විදුලිබල අමාත්‍ය හා කෘෂිකර්ම අමාත්‍ය ආදී වශයෙන් විවිධ තනතුරු හොබවන ලද අතර, ඒ මහතා කලක් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරයා ද වූයේ ය.

1989 දී එවක ජනාධිපතිව සිටි ප්‍රේමදාස මහතා විසින් විජේතුංග මහතා අගමැති ධුරය සඳහා පත්කරන ලද්දේ පක්ෂයේ යෝධයින් ව සිටි ගාමිණී දිසානායක සහ ඇතුලත්මුදලි යන මහත්වරුන් ද නොතකා හරිමිනි. ප්‍රේමදාස මහතාට අවශ්‍යවුණේ දේශපාලන වශයෙන් ඉදිරියට වැඩි බලාපොරොත්තු නැති කෙනෙකු ඒ තනතුරට පත්කරන්නටය. විජේතුංග මහතාගෙන් තමාට හානියක් නොවන බවද ප්‍රේමදාස මහතා දැන සිටියේය.

ඇතුලත්මුදලි මහතා 1993 අප්‍රියෙල් මස පලාත්පාලන මැතිවරණ රැළියකදී වෙඩිතබා ඝාතනය කිරීමත් සමග කොටි සංවිධානය ගැන නොව ඇතැමෙකුගේ චෝදනාව එල්ල වූයේ ප්‍රේමදාස මහතා වෙතටය. ඊට නුදුරු දිනකම එනම් 1993 මැයි 1 වෙනිදා කොටි බෝම්බකරුවෙකුගෙන් ජනාධිපති ප්‍රේමදාස මහතා ද ජීවිතක්ෂයට පත්විය.

හිස්වූ ධුරයට ශ්‍රීලංකා පාර්ලිමේන්තුව මගින් ජනාධිපති වශයෙන් ඒකමතිකව විජේතුංග මහතා තෝරාගනු ලැබූවාය. එම තනතුර තුළ ඔහුගේ සේවය ලිහිල්, චාම්, බහුතරයට හිතකාරී ලෙස ක්‍රියාත්මක වනු දක්නට ලැබිණ. ප්‍රේමදාස මහතා මෙන් ඔහු තද බල නීති පනවන්නෙකු නොවීය.

මේ කාලයේම අනෙක් පසින් ශ්‍රීලංකා නිදහස් පක්ෂය තුළින් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ජනප්‍රියත්වයට ඇදී එමින් තිබුණි. එහෙත් ඒ ජනප්‍රියත්වයට විජේතුංග මහතා එරෙහිවූයේ නැත.

ඉන් පෙර සිංහළ දේශපාලනඥයෙකු නොකී දෙයක් ජනාධිපති විජේතුංග මහතා නොබියව මුළු ලොවට ඇසෙන සේ ප්‍රකාශ කළේය

එනම් ශ්‍රීලංකාවේ ඇත්තේ ජනවාර්ගික ප්‍රශ්නයක් නොව තනිකරම දෙමළ කොටි ත්‍රස්තවාදය බවයි. එය සම්පූර්ණයෙන්ම විනාශකර දැමිය යුතු බවද විජේතුංග මහතා අවධාරණය කළේය. එතුමන්ගේ එම ප්‍රකාශනය අදත් ශ්‍රීලංකාවේ බහුතරය ගෞරව පූර්වකව සිහිපත් කරති. අනෙක් බොහෝ දේශපාලකයන්ට ද ත්‍රස්තවාදයට ත්‍රස්තවාදයයි බය නැතුව කියන්නට කටට පණ ආවේ ඉන් පසුව ය.

1994 දකුණේ පළාත්පාලන ඡන්දයෙන් රජය පැරදුණු නිසා විජේතුංග මහතා ඒ වසරේ අගෝස්තු මාසයේ පාර්ලිමේන්තුව විසිරුවා හැරියේය. කෙසේ නමුත් එජාපය පසු මැතිවරණයෙන්ද පැරදුණු නිසා ඔහු ඉතා නිහතමානීව හිතේ කිසිදු කහටක් නැතිව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අගමැති පදවියට පත් කළේය. එසේම ඔහු තමාට විරුද්ධ පක්ෂයක රජයක් සමග වුවද ඉතා සමගිව සිය කාල සීමාව පුරා සහයෝගය දැක්වූවේ ය.

1994 නොවැම්බර් මස පැවැත්වූ ජනපති වරණයෙන් කුමාරතුංග මහත්මිය ජයග්‍රහණය කරත්ම විජේතුංග මහතා ජනාධිපති ධුරය ඇයට බාරදී තනතුරෙන් ඉවත්ව මහනුවර තම ගමට ගියේ ය.

1988 දී ශ්‍රීලංකාවට ගිය ගමනකදී මා ඩී. බී. විජේතුංග මහතා මහතා හමුවන්නට එතුමන්ගේ කොළඹ නිල නිවහනට ගියේ එතුමන්ගේ පුද්ගලික ලේකම් වූත්, මගේ සමීප මිත්‍රයෙකු වූත් හැරල්ඩ් පීරිස් මහතා ද සමගය. විජේතුංග මහතා එවකට මධ්‍යාම පළාතේ ආණ්ඩුකාරයා ලෙස පත්ව සිටියේය. අපට තේ පැන් සංග්‍රහයක් ද පැවැත්වූ එතුමා මා හා පැයක් පමණ කතා බහ කළේ එංගලන්තයේත්, යුරෝපයේ රටවලත් වෙසෙන ශ්‍රීලාංකික ජනතාව ගැන හා ඔවුන්ගේ ජීවිතය කෙබඳුද යන විස්තර මගෙන් අසමිනි. එසේම විදේශයේ සිදුවන හොඳ දේ හා වැඩදායී දේ ගැන ලංකාවේ පුවත්පත් වලට නිතර ලියා ලංකාවේ ජනතාව දැනුවත් කිරීම හා නිවැරදිකිරීම පත්‍ර කලාවේදියෙකු ලෙස මගේ යුතුකමක් බව ද එදා එතුමන් කී බව මට මතක ය.

**1994 ජනවාරි මස මා ශ්‍රී ලංකාවට ගිය අවස්ථාවේ විජේතුංග ජනාධිපතිතුමා කොළඹ ජනපති මැඳුරේදී හමුවීමි. ඒ සතියේම මගේ ලිපියක් සිළුමිණ පුවත්පතේ පළවීය. ඒ කොටි ත්‍රස්තවාදීන් පැහැරගෙන ගොස් පසුව මුදා හරිනු ලැබූ බ්‍රිතාන්‍යයේ පත්‍රකලාවේදිනියක වන පෙනිලොපී ට්‍රීමේන් හමුවී මා කළ සම්මුඛ සාකච්ජාව ය. විජේතුංග මහතා ඒ පුවත්පත එතැනට ගෙන්වාගෙන කියවන්නට වීය. මෙහි මැද ඉන්නේ මා ය. වම්පස, එකල ජනාධිපති ලේකම්ව සිටි හැරල්ඩ් පීරිස් මහතා ය.**

1990 මා යළි ලංකාවට යනවිට විජේතුංග මහතා අගමැතිව සිටි සමයයි. එවරද නුවර දළදා වඳින්නට යන අතරමග මම හැරල්ඩ් සමග පිළිමතලාවේ ගමේ ගෙදරට උදය කාලයේ ගියෙමි. අගමැතිව සිටියත් සෑම සති අන්තයේම කොළඹ සිට පිළිමතලාවට පැමිණ තම කොට්ඨාශයේ ජනතාවට ඇහුම්කන් දීම විජේතුංග මහතා සිරිත වීය. විශාල පිරිසක් එදා එහි රැස්ව සිටියේය. ඒ අතරේ අප පිළිගත් එතුමා අපට සිංහළ කැවිලි හා තේ පැනින් සංග්‍රහ කළේය. දහවල් ආහාරය සඳහා නතර වන්නයයි කීවත් අපි එතුමන්ගෙන් සමුගෙන නික්ම ගියෙමු.

යළිත් 1994 ජනවාරි මාසයේ මා විජේතුංග මහතා දකින්නට යනවිට එතුමා ශ්‍රීලංකා ජනාධිපතිව සිටියේය. ඒදිනද මගේ සුවදුක් විචාරා මා ඒ සතියේ ලංකාවේ සිළුමිණ පත්‍රයට ලියා තිබූ ලිපියක් කියවා තිබූ බවද පැවසීය. ඒ ලිපියේ සඳහන් කොටි පැහැරගෙන ගිය ඉංග්‍රීසි කාන්තාව ගැනත් කොටි ත්‍රස්තවාදය ගැන සුදු ජාතිකයන් දරන ආකල්පය කෙබඳුද යන්නත් මගෙන් විමසීය. ඒ මා විජේතුංග ජනාධිපතිතුමා දුටු අවසන් වතාවය.


විජේතුංග මහතා සතු අනන්‍ය ලක්ෂණ බොහෝ වෙයි. තම පක්ෂයේ නොවන අගමැති මැති ඇමතිවරුන් හා සහයෝගයෙන් වැඩකළ ප්‍රථම ජනපති ඔහුය. බෙලි කපන, එකිනෙකා නුරුස්සන, කර්කශ දේශපාලන ලෝකයට එතුමා සුහදත්වය හා මහත්මා බවද එකතු කළේය. එසේම දේශපාලනය යනු හිස උදුම්මවාගත යුතු දෙයක් නොව සරල චාම්කම බවද විදහාපෑවේය. ඒ සියල්ලටම වඩා එතුමෝ චාම් සිංහළ සැබෑ ගැමියෙක්ද, යහපත් පවුල් ජීවිතයක් ගත කළ භක්තිමත් බෞද්ධයෙක් ද වූහ.

ඩී. බී. විජේතුංග මැතිතුමන්ට නිවන් සැප ලැබේවා!

♦ දයා ආනන්ද



## සිංහයාට සමීපවන නරියන් ගැන පංචතන්ත්‍රයේ පාඩමක් ඇත



**ඔ**ක්කොටම ඉස්සෙල්ලා **පංචතන්ත්‍රය** ගැන කියලා ඉන්නම්. පංචතන්ත්‍රය කියන්නෙ ක්‍රි. පූ. 3 වන ශත වර්ෂයේ භාරතයේ බරණැස විසූ **විෂ්ණු ශර්මන්** කියන සංස්කෘත පඬිවරයා ලියූ කතාන්තර පොතක්. මහිලාරෝප්‍ය කියන රජු තමාගේ පුත් කුමාරවරුන් තුන් දෙනාට රාජ්‍ය පාලනය ගැන උගන්වන්න කියලා බාරදුන්නේ විෂ්ණු ශර්මන් පඬිවරයාටයි. ඔහු මාස තුනක් ඇතුළත දේශපාලන විද්‍යාව ( political science ) කුමාර-වරුන්ට කතාන්තර මගින් උගන්වලා ඔවුන් රාජ්‍ය පාලනය සඳහා පුහුණුකරලා දුන්නා. ඒ කථාන්තර කොටස් පහකින් යුක්තයි. ඒ තමයි පංචතන්ත්‍රය ගැන කෙටි හැඳින්වීමක්.

ඉතින් මේ **පංචතන්ත්‍රය** මට හදිසියෙ මතක් වුණේ දැන් ලංකාවෙ යුද්ධයට සමාන්තරව අපේ සිවිල් සමාජයේ සිද්ධවෙන දේශපාලන හා දේශපාලනයෙන් බැහැර හැසිරීම් රටාවන් ගැන හිතන කොට. මොනවද මේ වෙන්නෙ? කොයිපැත්තටද මේ යන්නෙ? කියලා හිතන කොට මගේ ඔළුවට ආවෙ මේ වෙන්නෙ පංචතන්ත්‍රයේ පැහැදිලි කරපු කතා නේද කියලා. යක්කඩුවේ ප්‍රඥාරාම හුමුදුරුවො **වනකතා** කියලා ඉතා ලිහිල් භාෂාවෙන් ලියලා තියෙන්නෙත් මේ පංචතන්ත්‍රයේ කතාමයි. ටිබෙට් ජාතික **ඇස්. මහින්ද** හාමුදුරුවොත් මේ පංචතන්ත්‍ර කතා හොඳ ලිහිල් සිංහළ කවියට නගලා තියනවා.

නරියා නැත්නම් හිවලා කියන්නෙ කවුරුත් දන්න විදියට කැලෑවෙ ඉන්න අන්තිම කපටියෙක්. නරියා කියනවට වැඩිය හිවලා කියන වචනය සිංහල අපට වඩාත් හුරු මුගේ තියන මහා කැත, කාඩ, එපාකරපු ගතිය විග්‍රහ කරන්න. ඌ මහ හිවලෙක් කියලා කෙනෙකුට කිව්වම එයින් අදහස් කරන දේ මේකයි කියලා වෙන අටුවා ටීකා ලියන්න අවශ්‍ය නැහැ. හිවලා හැම තිස්සෙම මාන බලන්නනෙ කාට හෙණගැහිලා ගියත් කමක් නෑ තමන්ගෙ වැඩේකරගන්න. හිවලා යමකට කිට්ටුවෙන්නෙ කවුරු හරි ගොනාට අන්දවලා එයින් ලාභයක් ලබන්න. මේ හිවලෙක් කියලා අඳුනගන්න කොට විය යුතු හානිය වෙලා ඉවරයි.

සිංහයෙක් එක්ක යාළුවෙච්ච වැලේ වැල් නැති හිවලෙක් යාප්පුවෙන් සිංහයගෙ හිත දිනාගෙන තමන්ගෙ කායිකීය ඉටුකර ගත් හැටි පැහැදිලි කරන එස්. මහින්ද හාමුදුරුවන්ගෙ කවි කතාවෙ එන කවි දෙකක් මෙහෙමයි.

| | |
|---|---|
| දිනක් මේ හිවලා<br>සිංහයා බැහැ දැකලා<br>දෝත දී වැඳලා<br>කීය මෙලෙසින්<br>පසෙක සිටලා | ඇති යමක් කීමට<br>ඔබ හැර කෙනෙක් නෑ මට<br>අස්ව මස් කෑමට<br>බොහොම ආසයි<br>ස්වාමිනී මට |

නරිය එහෙම කියලා සිංහය රවට්ටගෙන අස්ව මස්ටික ඔක්කොම කැව විතරක් නෙවෙයි සිංහයත් අමාරුවෙ දැම්මා.

ශ්‍රීලංකාවෙ අවුරුදු 30 කට කිට්ටු කාලයක් ඇදි ඇදී යන දෙමළ කොටි ත්‍රස්තවාදය මර්දනය කරන්න එය පටන් ගත්දා සිට මේ වනතෙක් රට කරගෙන ආ ආණ්ඩු නොයෙක් පියවරවල් ගත්තා. හොඳ හෝ නරක හෝ ඒ ඒ රජයන් පියවර ගනිද්දි කොටින්ට පක්ෂපාතීව ලියපු වැඩ කරපු ඒ පිරිස් තවමත් ලංකාවෙ ඉන්නවා. උන් කටයුතු කළේ ඒ ත්‍රස්තවාදයේ මුවාවෙන් ප්‍රයෝජනයක් ගන්නයි. අනෙක් කාරණය තමයි බොරු සාම කාක්කොත් එක්ක එකතු වෙලා ලංකා රජය ත්‍රිවිධ හමුදාව සහ සිංහළ ජනතාව අපකීර්තියට පත්වන දේවල් රට ඇතුළේත් ජාත්‍යන්තර මාධ්‍යයටත් පැතිරවීම. උන් හැමදාම කිව්වෙ මේක දිනන්න බැරි යුද්ධයක් කියලා. මේ තමයි පංචතන්ත්‍රයෙන් පෙන්නා දෙන නරි. මේ නරි දැන් වෙන විදියකට වැඩ.

දැන් යුද්ධය අවසානයකට ගෙන එමින් අපේ සන්නද්ධ හමුදා කොටි බලය සුනුවිසුණු කරන කොට යුද්දෙ කවදාවත් දිනන්න බැරිය කියපු මේ නරි මෙන්න බොලේ ආණ්ඩුවෙ තද හිතවතුන් ගජයො වෙලා. රජයට ප්‍රශස්ති කියනවා. හමුදාව වර්ණනා කරනවා. ආණ්ඩුවෙන් යෝජනාකරන වැඩ වලට පැනලා උදව්කරනවා. වැඩ සීයයි. මොකද මේ? වෙන මොකවත් නෙවෙයි ඉදිරියට එන බව පේන පශ්චාත් ව්‍යාපාර ටෙන්ඩර් ආදී කටයුතු වලට හොට දාගන්නයි මේ වෑයම.

නරිය කැලෑවෙ හිටියට කමක් නෑ, වැඩිය ළඟට කිට්ටු කරගන්න විස්වාස කරන්න එපා. කිසිම සිංහයෙක් පාඩමක් ඉගනගත්තෙ නැහැ කියලා පංචතන්ත්‍රයෙම කියනවා. ඒක තකතිරුකමට වඩා සිංහයගෙ ස්වභාවය වෙන්න ඇති.

♦ වෙලේගෙදර රාළ London